# ප්‍රධාන කරුණු පිළිබඳ ලේඛනය

Version Date
Document Ver.3 01/01/2023

මෙම ලේඛනය තුළින් සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී විසින් සිය අපේක්ෂිත ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන තැන්පතු හා ණය සේවාවන් පිළිබඳ මූලික තොරතුරු සපයනු ලබයි. ප්‍රකාශිත නියමයන්, කොන්දේසි සහ අදාළ ගාස්තු හා අයකිරීම් ඕනෑම මොහොතක සංශෝධනය කිරීමේ, ඉවත් කිරීමේ හා ඇතුළත් කිරීමේ අයිතිය සමාගම සතුය.

## ස්ථාවර තැන්පතු ගිණුම්

### 1. හැඳින්වීම

ස්ථාවර තැන්පතුවක් යනු කෙටි කාලීන හෝ දිගු කාලීන වශයෙන් ආයෝජනය කිරීම සඳහා අවස්ථාව සළසා දී ඇති සුරක්ෂිත ගිණුම් වර්ගයකි. එහිදී අවම මාස 1ක සිට උපරිම වසර 5ක් දක්වා කාලයක් සඳහා ඔබගේ වටිනා මුදල් ආයෝජනය කිරීමේ අවස්ථාව අපි ඔබ වෙත ලබා දෙන්නෙමු. ඉතුරුම් ගිණුමකට වඩා වැඩි පොලියක් ස්ථාවර තැන්පතු ගිණුමක් වෙත ලබා දෙන අතර ආයෝජන කාලය මත ඊට ගෙවනු ලබන පොලී අනුපාතය වෙනස් වනු ලබයි. සම්පූර්ණ කරන ලද ස්ථාවර තැන්පතු (FD) අයදුම් පත්‍රයක් තුළින් හා සමාගම මඟින් නිකුත් කරනු ලබන පෝරමයන්ට අදාළ KYC විස්තර ලබා දීම තුළින් ස්ථාවර තැන්පතු ගිණුමක් විවෘත කළ හැකිය.

### 2. ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කළ හැක්කේ කාටද?

- අවුරුදු 18ට වැඩි ශ්‍රී ලාංකිකයන් ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලබන අතර 18ට අඩු ශ්‍රී ලාංකිකයන් තනි හෝ ඒකාබද්ධ තැන්පතු ආරම්භ කිරීම සඳහා සුදුසුකම් නොලබයි.
- වලංගු නේවාසික වීසා බලපත්‍රයක් සහ ද්විත්ව පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකික නොවන පුද්ගලයන්ට.
- විදේශීය පුරවැසියන් විසින් සිදු කරන තනි හෝ ඒකාබද්ධ කිසිඳු තැන්පතුවක් අනුමත නොකෙරේ.

### 3. අරමුදල් තැන්පත් කරන ආකාරය

- ස්ථාවර තැන්පතු/මුදල් ආයෝජනය සඳහා ඔබේ අරමුදල් යොමු කිරීමට පහත ක්‍රමයන් භාවිත කළ හැකිය.
- ''සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී'' ගිණුමෙන් බැංකු චෙක්පත ලබා ගත යුතුය.
- තැන්පත්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සීට අනන්‍යතාව තහවුරු කළ හැකි වෙනත් ඕනෑම ලේඛනයක් ඉදිරිපත් කොට සෘජු තැන්පතුවක් (SLIPS/CEFT /RTGS) විවෘත කිරීම

ඔබගේ ස්ථාවර තැන්පතු ආයෝජනය වෙනුවෙන් අරමුදල් සපයා ගැනීමට අවශ්‍ය වේ නම් එය ඉහත සඳහන් ක්‍රමයන්හි එකතුවකින් සිදු කළ හැකිය. එහෙත් ස්ථාවර තැන්පතු ගිණුම සක්‍රිය වන්නේ ආයෝජනය කර ඇති මුළු වටිනාකමට පමණක් බව මතක තබා ගත යුතුය.

## 4. ස්ථාවර තැන්පතුවක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ

ඔබගේ ස්ථාවර තැන්පතු ආයෝජනය වෙනුවෙන් අරමුදල් සපයා ගැනීමට අවශ්‍ය වේ නම් එය ඉහත සඳහන් ක්‍රමයන්හි එකතුවකින් සිදු කළ හැකිය. එහෙත් ස්ථාවර තැන්පතු ගිණුම සක්‍රිය වන්නේ ආයෝජනය කර ඇති මුළු වටිනාකමට පමණක් බව මතක තබා ගත යුතුය.

- ස්ථාවර තැන්පතුවක් සඳහා වන අවම තැන්පතු වටිනාකම රුපියල් 10,000.00කි.
- ස්ථාවර ගිවිසුම් කාලය මාස 1 සිට උපරිම වසර 5ක් දක්වා වේ.
- ආයෝජනය කළ හැකි ප්‍රාග්ධන මුදලේ උපරිමය සීමා රහිතය.
- ආයෝජනයෙන් පසු ඔබට ගනුදෙනු කළ නොහැකි හා මාරු කළ නොහැකි ආකාරයේ ස්ථාවර තැන්පතු සහතිකයක් ලබා දෙනු ඇත.
- කල් පිරීමේ දිනයට පෙර ස්ථාවර තැන්පතුව විවෘත කිරීමේදී ලබා දුන් මෙහෙයුම් උපදෙස් මත පදනම්ව කල් පිරීමේ උපදෙස් සම්බන්ධයෙන් යම් සංශෝධනයන් සිදු කළ හැකිය.

## 5. පොලිය සහ පොලිය ගෙවීම

පවතින වෙළෙඳපොළ අනුපාතයන් හා මහ බැංකුව විසින් වරින් වර සිදු කරනු ලබන ප්‍රතිපත්තිමය අනුපාතයන් අනුව සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් වෙතින් ඔබේ ස්ථාවර තැන්පතු ගිණුමට ලබා දෙන පොලී අනුපාතය තීරණය කරනු ඇත.

www.softlogicfinance.lk වෙත පිවිසීමෙන් නවතම පොලී අනුපාතයන් පිළිබඳ ඔබට දැනගත හැකියි.

දින 365 මත පදනම්ව පොලිය ගණනය කරනු ලබන අතර මාසිකව හෝ කල් පිරීමේ වශයෙන් පොලී ගෙවීමේ වාර ගණන ඔබට තීරණය කළ හැකිය.

එහිදී ඔබ විසින් ඉල්ලුම් කළ වාර ගණන අනුව පොලී මුදල් බැර වන අතර ඒ සඳහා පහත සඳහන් විකල්ප ක්‍රමයන් භාවිත කළ හැකිය.

1. SLIPS මාරු කිරීම
2. මුදල්
3. ගිණුමට බැර වන චෙක්පත්
4. Softlogic Finance ඉතුරුම් ගිණුමට

## 6. පොලී මත අත්තිකාරම් ආදායම් බදු (AIT)

2021 අංක 10 සහ 2022 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධිත 2017 අංක 24 දරන (IRA) ආදායම් බදු පනතට අනුව - 2023 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි අංක SEC/2022/E/02 චක්‍රලේඛය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.

**5%** ක අනුපාතයකින් ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් ඇති පොලී හෝ වට්ටම් ගෙවීමෙන් පුද්ගලයෙකු අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතුය.

අනේවාසික පුද්ගලයෙකු වන ඕනෑම තැන්පතු හිමියෙකු අඩු AIT අනුපාතයක් (5% අනුපාතයට සාපේක්ෂව) සොයන්නේ නම්, තැන්පතු හිමියා AIT අඩු කිරීමට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙතින් බදු නිෂ්කාශන සහතිකයක් ලබා ගත යුතුය.

### 7. අවලංගු කිරීම

කල් ඉකුත්වන දිනට පෙර තැන්පතුවක් ආපසු ගැනීමට ආයෝජකයාට තීරණය කළ හැකිය. එවන් අවස්ථාවකදී ගනුදෙනුකරු විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

එහිදී ඒ වන විට පවතින වෙළෙඳපොල තත්වයන් මත පදනම්ව ඉල්ලීම් වලට එකඟ වීමේ හැකියාව සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් සතු අතර ඒ සඳහා දඩුවම් හා ගාස්තු අය කරනු ඇත. තවද කල් නොපිරුණු මුදල් ආපසු ගැනීමකදී, කල් පිරීමට පෙර මුදල් ආපසු ගැනීමේ අවස්ථාවකදී මහ බැංකුවේ නියෝගයන්ට අනුව ගනුදෙනුකරු වෙත මුලින් එකඟ වූ පොලී අනුපාතයට වඩා අඩු පොලියක් හිමිවිය හැකිය. පහත සඳහන් ගෙවීම් ක්‍රමයන් මත පදනම්ව ඔබ කරන ඉල්ලීම් මත ස්ථාවර තැන්පතු අවලංගු කිරීම සිදු වේ.

1. වෙනත් ඕනෑම බැංකුවක් වෙත සිදු කරන හුවමාරුව.
2. මුදලින් ගෙවීම.
3. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් ඉතිරි කිරීමේ ගිණුමක් වෙත මාරු කිරීම.
4. ගිණුමට බැර වන චෙක්පත.

### 8. ගාස්තු සහ අය කිරීම්

ස්ථාවර තැන්පතු සිදු කිරීමේදී සෘජුව ගෙවිය යුතු ගාස්තු නොමැත. කලින් කල සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් වෙතින් නිකුත් කළ අනුපාතයන් මත ආයෝජන පාලනය කරනු ලබයි.

| | |
|---|---|
| Charge for issuing Visa Letter | Rs. 2,000 |

### 9. ස්ථාවර තැන්පතු සඳහා වන ණය

ස්ථාවර තැන්පතුවට අදාළ ණය ඉල්ලුම සහ එම ස්ථාවර තැන්පතු ගිණුමේ මෙහෙයුම් උපදෙස් පරිදි ඔබේ ස්ථාවර තැන්පතු ගිණුමෙන් උපරිම 80%ක් දක්වා ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඇත.

## ඉතිරිකිරීමේ ගිණුම්

### 1. ඉතිරි කිරීමේ ගිණුම් ආරම්භ කළ හැක්කේ කාටද?

ඉතිරි කිරීමේ ගිණුම් පහත අයුරින් විවෘත කළ හැකිය.

- තනි පුද්ගල -තනි තනිව හෝ ශ්‍රී ලාංකේය පුරවැසියන් සමඟ පමණක් හවුලේ ගිණුම් විවෘත කළ හැකිය.
- ළමයින් (බාලවයස් කරුවන්) - ශ්‍රී ලාංකික පුරවැසියකු වන භාරකරුවකුට බාල වයස්කරුවන් වෙනුවෙන් වන ගිණුම් විවෘත කළ හැකිය. වයස අවුරුදු 18න් පසු දරුවන්ට ඔවුන්ගේ ගිණුම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව හිමිවේ. 2007 අංක 01 දරන මූල්‍ය සමාගම් සඳහා වන (බාලවයස්කරුවන් සඳහා වන ඉතුරුම් ගිණුම් පවත්-වාගෙන යාම ) මාර්ගෝපදේශ යටතේ බාල වයස්කාර (ළමා) ගිණුම් ක්‍රියාත්මක වේ. කෙසේ වුවද වසර 18 සම්පූර්ණ වන විට ළමා ඉතුරුම් ගිණුම අදාළ මුදල් ශේෂයද සමඟ වැඩිහිටි ඉතුරුම් ගිණුමක් බවට පරිවර්තනය වනු ඇත. එහිදී නව ගිණුම් පොතක්ද ලබා දෙනු ලබයි. බාල වයස් කරුවන් සඳහා ගිණුම් ආරම්භ කිරීමේදී උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එම මුල් පිටපත තුල බලයලත් නිළධාරියාගේ අත්සන සමඟ රබර් මුද්‍රාව තිබීම අනිවාර්ය වේ.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් - වයස අවුරුදු 60 සම්පූර්ණ වූ වැඩිහිටි පුද්ගලයින් මීට සුදුසුකම් ලබයි.

එහිදී සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව හා සෑම ආයතනයකටම අදාළ නීති රීතිවලට යටත්ව ඕනෑම අයෙකුට විවෘත කළ හැකිය.

## 2. ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීම සඳහා

ඔබගේ ඉතිරි කිරීමේ ගිණුම විවෘත කිරීම සඳහා ළඟම ඇති ශාඛාවට පැමිණෙන ලෙස අපි ඔබට ඇරයුම් කර සිටිමු. ගිණුම විවෘත කිරීමට අනුගමනය කළ යුතු පහත ලියකියවිලි අපගේ කාර්ය මණ්ඩලය විසින් ඔබට ලබා දෙනු ඇති අතර ඔබ විසින් එය සම්පූර්ණයෙන් කියවා පිරවිය යුතුය.

- ගිණුම් විවෘත කිරීමේ අයදුම් පත්‍රය
- ගනුදෙනුකරුවන් හඳුනාගැනීම හා තහවුරු කර ගැනීමේ (KYC) පෝරමය

මේ සඳහා ඔබ රැගෙන ආ යුතු වන්නේ ජාතික හැඳුනුම්පත/ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය පමණි. ඔබගේ වත්මන් පදිංචිය, ජාතික හැඳුනුම්පතෙහි/ගමන් බලපත්‍රයෙහි හෝ රියදුරු බලපත්‍රයෙහි සඳහන් ලිපිනයෙන් වෙනස් වේ නම් වලංගු ලිපිනය තහවුරු කිරීම සඳහා අදාල ලියකියවිලි (මාස 3ක් ඉක්මවා නොගිය බිල්පත්/ උපයෝගිතා බිල්පත්/ වෙනත් බැංකු ප්‍රකාශනයන් හෝ වෙනත් බැංකු ගිණුම් පොතක පිටපතක්/ රාජ්‍ය ආයතනයක් විසින් ලබා ගත් ලිපියක්) ගෙන ආ යුතුය.

ආයතනයක් සඳහා ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේදී ඒ සඳහා අවශ්‍ය වන ලියකියවිලි පිළිබඳ අපගේ කාර්ය මණ්ඩලය විසින් ඔබව දැනුවත් කරනු ඇත.

## 3. ආරම්භක තැන්පතු වටිනාකම සහ අවම ශේෂය

රුපියල් 1,000ක ආරම්භක තැන්පතුවක් තුළින් තැන්පත්කරුට ඉතිරුම් ගිණුමක් ආරම්භ කළ හැකි අතර ඉතිරි කිරීමේ ගිණුම් වර්ගය අනුව ආරම්භක තැන්පතු මුදල වෙනස් විය හැකිය.

- රුපියල් 1,000.00ක අවම ශේෂය සෑමවිටම පවත්වාගෙන යායුතු අතර ඔබ තෝරාගත් ඉතිරි කිරීමේ ගිණුම් වර්ගය සඳහා සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් විසින් කලින් කලට නියම කරනු ලබන අවම ශේෂය පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

- ඉතිරි කිරීම ගිණුම සඳහා අනුමත ශේෂයට වඩා ගිණුමෙහි ඇති ශේෂය අඩු වූ විට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අවම ශේෂ ගාස්තුවක් අය කරනු ලබන අතර එම ගිණුම විධිමත්ව පවත්වා ගැනීමට ගනුදෙනුකරුවන්ට උපදෙස් ලබා දිය යුතුය.

- යම්කිසි ගිණුම් හිමියකු අඛණ්ඩව අවම ශේෂයට වඩා අඩු මුදලක් ගිණුමෙහි පවත්වාගෙන යන්නේ නම් ඒ පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් කර එවැනි ගිණුමක් වසා දැමීම සඳහා වන සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් සතු අයිතිය භාවිත කළ හැකිය.

## 4. ඉතිරි කිරීමේ ගිණුමට අදාළ පොලිය

- ඉතුරුම් ගිණුම් සඳහා ගෙවිය යුතු පොලී අනුපාතයන් මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුව කළමනාකරීත්වය විසින් කලින් කලට තීරණය කරනු ලබයි.

- පොලිය දෛනිකව ගණනය කරනු ලබන අතර මාසිකය ගිණුමට බැර කරනු ලබයි.

- අවම ශේෂයට අඩු ශේෂයක් පවත්වාගෙන යනු ලබන ගිණුම් සඳහා පොලී ගෙවීමක් සිදු නොවේ.

- ඉතුරුම් ගිණුම් සඳහා කිසිඳු වරණීය අනුපාතයක් නොගෙවනු ලබයි.

- www.softlogicfinnace.lk වෙත පිවිසීමෙන් නවතම පොලී අනුපාතයන් පිළිබඳ ඔබට දැනගත හැකියි.

## 5. පොලී මත අත්තිකාරම් ආදායම් බදු (AIT)

2021 අංක 10 සහ 2022 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධිත 2017 අංක 24 දරන (IRA) ආදායම් බදු පනතට අනුව - 2023 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි අංක SEC/2022/E/02 චක්‍රලේඛය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව.

5% ක අනුපාතයකින් ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් ඇති පොලී හෝ වට්ටම් ගෙවීමෙන් පුද්ගලයෙකු අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතුය.

අනේවාසික පුද්ගලයෙකු වන ඕනෑම තැන්පතු හිමියෙකු අඩු AIT අනුපාතයක් (5% අනුපාතයට සාපේක්ෂව) සොයන්නේ නම්, තැන්පතු හිමියා AIT අඩු කිරීමට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙතින් බදු නිෂ්කාශන සහතිකයක් ලබා ගත යුතුය.

## 6. ඉතිරි කිරීමේ ගිණුම් සඳහා නම් කිරීම

ඉතුරුම් ගිණුම ආරම්භ කරන මොහොතේම හෝ ඊට පසුව ඒ සඳහා පුද්ගලයකු නම් කිරීමට ඔබට අවශ්‍ය නම් නාමයෝජනා පත්‍රයෙහි නම් කරන ලද තැනැත්තාගේ විස්තර, නම් කරන තැනැත්තාගේ ප්‍රතිශතය සහ ගිණුම් විස්තර ඇතුළත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් අවශ්‍ය සහයෝගය ලබා ගැනීමට ඔබ පැමිණෙන ශාඛාවේ අපගේ සේවක සාමාජිකයකු අමතන්න.

## 7. මුදල් තැන්පතු/ චෙක්පත් තැන්පතු

- ඔබගේ අදාළ ගිණුමට මුදල් තැන්පත් කිරීම සඳහා ඕනෑම සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් ශාඛාවකින් ලබා ගත හැකි තැන්පතු පත්‍රය සම්පූර්ණ කර මුදල් කවුන්ටරයට භාර දිය යුතුය.

- කවුන්ටරය තුළින් තෙවැනි පාර්ශවයකටද ඔබේ ගිණුමට මුදල් තැන්පත් කළ හැකිය. එහිදී තෙවන පාර්ශවයක් විසින් රුපියල් 200,000.00 කට වැඩි තනි හෝ බහු තැන්පතුවක් සිදු කරන විට සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් විසින් තෙවන පාර්ශවීය තැන්පත්කරුගේ නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය ලබා ගනු ලබයි. එය මුදල් තැන්පත් කිරීම සඳහා වන තෙවන පාර්ශවයේ අරමුණෙහි ස්වභාවය, අරමුදල් මූලාශ්‍රය තැන්පතුවට සම්බන්ධ වන ආකාරය සඳහන් කිරීමේදී වැදගත් වේ.

- එය චෙක්පත් මඟින් සිදුකරන තැන්පතුවක් නම්, චෙක්පත සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී නමට ලබාගත යුතු අතර එය පිළිබඳ තහවුරු කරගත් පසු ගිණුමට මුදල් බැර කෙරේ.

## 8. මුදල් ආපසු ගැනීම

- ඔබගේ ඉතුරුම් ගිණුම තුළින් ශාඛා ජාලය හරහා මුදල් ආපසු ලබා ගැනීමට අවශ්‍ය වූ විට ඕනෑම සොෆ්ට්ලොජික් ශාඛාවකට පැමිණීම අත්‍යාවශ්‍ය වේ. එහිදී සොෆ්ට්ලොජික් ආයතනය මඟින් ඔබගේ අනන්‍යතාවය සඳහා ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනුමත ලියවිල්ලක් සමඟ නිවැරදි ආකාරයෙන් සම්පූර්ණ කළ මුදල් ආපසු ගැනීමේ පත්‍රයක් ඉල්ලා සිටිනු ඇත.

- ඒකාබද්ධ ඉතුරුම් ගිණුමක ' දෙදෙනාම අත්සන් කළ යුතුය' ලෙස උපදෙස් දී ඇත්නම් ගනුදෙනුව සම්පූර්ණ කිරීම සඳහා දෙපාර්ශවයම ශාඛාවේ සිටීම අනිවාර්යය වේ.

- එහි 'එක් පාර්ශවයක් පමණක්' යනුවෙන් උපදෙස් දී ඇත්නම් එවැනි එක් පාර්ශවයක අත්සනින් ගනුදෙනුව සිදු කළ හැකිය.

- තෙවැනි පාර්ශවයකට ඔබේ ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට අවසර හිමි නොවේ.

- ඔබ අසනීප තත්වයක පසුවේ නම් හෝ මුදල් ආපසු ගැනීමේ පත්‍රයට අත්සන් කිරීමට නොහැකි නම් ඒ සම්බන්ධ සාක්ෂිකරුවකුට අමතරව ඔබට එම ගනුදෙනුව අවබෝධ කරගත හැකි තත්වයක සිටින බවටත්, ඔබ පියවි සිහියෙන් සිටින බවටත් වෛද්‍යවරයකු විසින් සිදු කළ තහවුරු කිරීමක් ඉදිරිපත් කළ යුතුය. එවන් අවස්ථාවකදී මුදල් ආපසු ලබාදීම සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සීහි නිළධාරියකු ඉදිරිපිටදී සිදු කරනු ලබයි.

### 9. බැංකු පාස් පොත හා ප්‍රකාශ

- මූල්‍ය වෙළෙඳපොල තුළ දැනට ක්‍රියාත්මක වන තත්වය නම් ඒ සඳහා ඔබ විශේෂ ඉල්ලීමක් සිදු නොකළහොත් ඔබගේ සියලු ගිණුම් වෙනුවෙන් ප්‍රකාශ ලබා දෙනු ඇත.

- ඔබගේ ඉල්ලීම සහ ගිණුම් වර්ගය අනුව පාස් පොත ලබා දෙයි.

- මුදල් තැන්පත් කිරීම හෝ ආපසු ගැනීම සඳහා ඔබගේ පාස් පොත රැගෙන ඒමේ අවශ්‍යතාවයක් නොමැත. එහෙත් යාවත්කාලීන කිරීම සඳහා පාස් පොත ඉදිරිපත් කළ යුතුය.

- අපි ගනුදෙනුකරුවන් සඳහා වන ප්‍රකාශයන් සහ භෞතික ප්‍රකාශයන් ලබා දීමට කටයුතු කරන අතරම ඔබගේ ඉල්ලීම මත ගිණුම විවෘත කරන අවස්ථාවේදී ඔබ ලබා දුන් ලිපිනයට එම භෞතික ප්‍රකාශයන් මාසික/ කාර්තුමය වශයෙන් ඔබට ලැබෙනු ඇත.

### 10. අය කිරීම්/ ගාස්තු

ස්ථාවර උපදෙස්, පාස් පොතෙහි අනු පිටපතක් නිකුත් කිරීම, ගිණුම් වසා දැමීම වැනි ඕනෑම ගනුදෙනුවකට ගාස්තු අය නොකෙරේ.

## වාණිජ පත්‍රිකාව

### 1. හැඳින්වීම

වාණිජ පත්‍රිකාව CP ලෙසද හැඳින්වේ, සාමාන්‍යයෙන් වසරක් දක්වා කාලයක් සඳහා අරමුදල් රැස් කිරීම සඳහා සමාගම විසින් නිකුත් කරන ලද කෙටි කාලීන ණය උපකරණයකි.

### 2. commercial Paper සඳහා ආයෝජනය කළ හැක්කේ කාටද?

- අවුරුදු 18 ට වැඩි සහ 18 ට අඩු ශ්‍රී ලාංකික පුරවැසියන් තනි තනිව හෝ ඒකාබද්ධව තැන්පතු භාර ගැනීමට සුදුසුකම් නොලබයි.
- වලංගු නේවාසික වීසා සහ ද්විත්ව පුරවැසිභාවය හිමි ජාතික නොවන අය
- විදේශ පුරවැසියන්ගෙන් ඒකාබද්ධව හෝ තනිව තැන්පතු භාරගත නොහැක.

## 3. අරමුදල් තැන්පත් කරන ආකාරය

- වාණිජ පත්‍රයේ ආයෝජනය සඳහා ඔබේ අරමුදල් යොමු කිරීමට පහත ක්‍රමය භාවිතා කළ හැක
- "SOFTLOGIC FINANCE PLC" ගිණුමට බැංකු චෙක්පතක් ලබා ගත යුතුය
- සෘජු තැන්පතු (SLIPS/CEFT/RTGS ) ආයෝජකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ SF PLC වෙත පිළිගත හැකි වෙනත් හඳුනාගැනීමක්

අවශ්‍ය නම් ඉහත ක්‍රමවල එකතුවක් හරහා ඔබේ වාණිජ කඩදාසි ආයෝජන සඳහා අරමුදල් යොමු කළ හැක. නමුත් වාණිජ කඩදාසි ගිණුම සක්‍රීය කරනු ලබන්නේ ආයෝජනයේ සම්පූර්ණ වටිනාකම පමණි.

## 4. වාණිජ පත්‍රයේහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ

- වාණිජ පත්‍රිකාවක අවම ආයෝජන වටිනාකම රුපියල් මිලියන 1.0 කි
- ආයෝජන කාලය මාස 01 සිට උපරිම මාස 12 දක්වා (දින 365 පදනම)
- ආයෝජනය කළ යුතු ප්‍රාග්ධන මුදලේ උපරිම සීමාවක් නොමැත.
- ඔබට සාකච්ඡා කළ නොහැකි සහ මාරු කළ හැකි උපකරණයක් නොවන වාණිජ කඩදාසි සහතිකයක් නිකුත කරනු ලැබේ.

## 5. පොලිය සහ පොලිය ගෙවීම

ඔබේ වාණිජ පත්‍රිකාවෙහි ආයෝජනය සඳහා යොදන පොලී අනුපාත SF PLC විසින් නියම කරනු ලබන්නේ පවතින වෙළෙඳපොළ අනුපාත සහ මහ බැංකුව විසින් කලින් කලට සිදුකරන ප්‍රතිපත්ති අනුපාතිකය අනුවය.

පොලී දින 365 මත පදනම්ව ගණනය කරනු ලබන අතර මාසික හෝ කල්පිරීමේ සිට පොලී ගෙවීම් වාර ගණන තෝරා ගැනීමට ඔබට අවස්ථාව ඇත.

## 6. අවලංගු කිරීම

ආයෝජකයාගේ ඉල්ලීම මත සමාගම, එහි අභිමතය පරිදි, වාණිජ පත්‍රිකාවේ කාලසීමාව සම්පූර්ණ කිරීමට පෙර වාණිජ පත්‍රිකාව ආපසු ගැනීමට ඉඩ දිය හැකිය. වාණිජ පත්‍රිකා අකාලයේ ආපසු ගැනීම සඳහා සමාගම විසින් ප්‍රාග්ධන මුදල ගෙවිය යුතුය.

පහත දැක්වෙන ගෙවීම් ක්‍රමයට ඔබගේ ඉල්ලීම මත පදනම්ව සෘජු අවලංගු කිරීම සිදු කෙරේ

1. CEFT/SLIPs වෙනත් ඕනෑම බැංකුවක් වෙත සිදු කරන හුවමාරුව
2. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් මුල්‍ය ඉතුරුම් ගිණුම් වෙත මාරු කිරීම.
3. ගිණුමට බැර වන චෙක්පත.

## 7. ගාස්තු සහ අය කිරීම්

CPs ආයෝජනය කිරීමේදී සෘජුවම ගාස්තු අය නොකෙරේ. SF PLC විසින් කලින් කල ප්‍රකාශයට පත් කරන ලද මිල ගණන් යටතේ ආයෝජන සිදු කෙරේ.

| | |
|---|---|
| Charge for issuing Visa Letter | Rs. 2,000 |

**Softlogic Finance PLC**
No. 13, De Fonseka Place, Colombo 4.
Tel: (+94) 11 2 104 204 I Fax: (+94) 11 2 359 799 E-mail: info@softlogicfinance.lk | Web: www.softlogicfinance.lk